සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2021 ජූලි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2021-10-31
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  1. (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  2. (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  3. (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  4. (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  5. (5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සැම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  6. (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, වුවමනාවක් (want) සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ආහාර.
(2) රැකියා සුරක්ෂිතභාවය.
(3) වාසස්ථාන.
(4) ඇඳුම්.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, බද්ධ ව්‍යාපාරයක (Joint Venture) ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) ලියාපදිංචිය අනිවාර්ය වේ.
(2) පාර්ශව දෙකක් හෝ වැඩි පිරිසක් සහභාගී වීම.
(3) කෙටිකාලීන අරමුණක් ඉටුකරගැනීම සඳහා එය පිහිටුවීම.
(4) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

**1.3** කේවලස්වාමි ව්‍යාපාරයක් සමඟ සැසඳීමේදී, හවුල් ව්‍යාපාරයක ඇති විශේෂ වාසිය වන්නේ:

(1) ගිණුම් තැබීම අනිවාර්ය වීම.
(2) ඉක්මනින් තීරණ ගැනීමේ හැකියාව.
(3) වගකීම අසීමිත වීම.
(4) අවදානම බෙදාහැරීම.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, සෘජු බෙදාහැරීමේ මාර්ගයක් වන්නේ කුමක් ද?

(1) නිෂ්පාදකයා → පාරිභෝගිකයා.

(2) නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා.

(3) නිෂ්පාදකයා → නියෝජිතයා → පාරිභෝගිකයා.

(4) නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, චෙක්පතක් අගරුවීම සඳහා හේතුවක් වන්නේ කුමක් ද?

(1) ගිණුමේ මුදල් නොමැතිවීම.

(2) ගිණුම වසා තැබීම.

(3) අණකරු විසින් බැංකු ගිණුමෙන් ගෙවීම නවතා තිබීම.

(4) ඉහත සඳහන් සියල්ලම.

**1.6** පුද්ගලයෙකුට රක්ෂණය කළ **නොහැකි** විෂය කරුණක් සඳහා උදාහරණයක් වන්නේ:

(1) පුද්ගලයෙකුගේ ජීවිතය.

(2) ව්‍යාපාරයක අනාගත ගිණුම්කරණ අලාභ.

(3) මාර්ගස්ථ මුදල්.

(4) හදිසි අනතුරුවලින් විය හැකි අවදානම.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, සේවාවක ලක්ෂණයක් ලෙස සළකනු ලබන්නේ කුමක් ද?

(1) එය ස්පර්ශ කළ හැකි වේ.

(2) එය ගබඩා කළ හැකි වේ.

(3) එය නිපදවීම සඳහා විශාල ශ්‍රමයක් අවශ්‍ය වේ.

(4) එය ස්වභාවය අනුව සමජාතීය වේ.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු **නොලබන්නේ** කුමක් ද?

(1) සේවක අර්ථසාධක අරමුදල.

(2) බලපත්‍රලාභී වාණිජ බැංකු.

(3) කොළඹ කොටස් හුවමාරුව.

(4) කල්බදු සමාගම්.

**1.9** ඉදිරිදාතම (postdated) චෙක්පතක් යනු:

(1) අනාගත දිනයක් සහිතව නිකුත් කළ චෙක්පතකි.

(2) අතීත දිනයක් සහිතව නිකුත්කළ චෙක්පතකි.

(3) වලංගු කාලසීමාව ඉක්මවා ගිය චෙක්පතකි.

(4) වලංගු කාලසීමාවක් නොමැති චෙක්පතකි.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, සමාජයීය ව්‍යවසායකත්වය (Social Entrepreneurship) යන්න නිවැරදිව විස්තර කරන්නේ කුමකින් ද?

(1) සමාජයීය ව්‍යවසායකත්වය යනු ව්‍යාපාර සංවිධානයන්හි සේවකයන් විසින් ජනනය කරන නිර්මාණශීලීත්වය වේ.

(2) නව්‍යකරණය මගින් සමාජයට සිදුකරන සේවාව, සමාජයීය ව්‍යවසායකත්වයේ ඇතුළත් වේ.

(3) සමාජයීය ව්‍යවසායකත්වය යනු පාරිසරික ගැටළු පිළිබඳ අවධානය යොමුකිරීමේ ව්‍යවසායකත්ව ක්‍රියාමාර්ගයක් වේ.

(4) ලෝකය සමඟ භාණ්ඩ වෙළඳාමේ නියැලීම සමාජයීය, ව්‍යවසායකත්වයේ ඇතුළත් වේ.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** තනි පුද්ගලයන්ගේ සමාජයීය ක්‍රියාකාරකම් (social functioning) හි ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ පුද්ගල කණ්ඩායමක් විධිමත් සංවිධානයක් ලෙස නිර්වචනය කළ හැක.

**1.12** සමාගමක මෙහෙයුම් පිළිබඳ නියාමනයන් / රෙගුලාසි නිශ්චිතව දැක්වෙන ප්‍රධාන ලියවිල්ල සාංගමික ව්‍යවස්ථාවලිය වේ.

**1.13** චෙක්පතක් රේඛණය කර ඇත්නම්, එම චෙක්පත ලබන්නාට (ආදායකයාට) එය බැංකු කවුන්ටරයෙන් සෘජුවම මුදල් කරගත හැකිය.

**1.14** ව්‍යවසායකයෙක් හට අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාවක් පවතී.

**1.15** ආසන්න මුදල් (near money) යනු 100% ක් ද්‍රවශීල මුදල් වේ.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ හැකි විවිධ වර්ගයේ සමාගම් දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** මුදලේ කාර්යයන් යටතේ එන "විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම" (a medium of exchange) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.18** චෙක්පතක් පිටසන් කිරීම (endorsement) යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.19** කාන්තා ව්‍යවසායකත්වය මුහුණ දෙනු ලබන අභියෝග (challenges) දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙක(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

සීමාසහිත පෞද්ගලික සමාගමක් වන **COCO සමාගම,** 2003 වර්ෂයේදී සංස්ථාපනය කරනු ලැබිය. **COCO සමාගම** යුරෝපීය වෙළෙඳපොළට "වියළි පොල්" (dried coconuts) අපනයනයෙහි යෙදී සිටී. වර්තමානය වන විට, **COCO සමාගම** ශ්‍රී ලංකාවේ ස්ථාන හතරක කර්මාන්තශාලා පවත්වාගෙන යනු ලබන අතර, සේවයේ නියුතු පිරිස 200 ක් පමණ වේ. **COCO** සමාගමේ ප්‍රධාන කාර්යාලය කොළඹ නගරයේ පිහිටා ඇත. ප්‍රධාන කාර්යාලය සහ කර්මාන්තශාලා අතර, සියලුම මෙහෙයුම් කටයුතු ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධතියක් [Enterprise Resource Planning (ERP) system] මගින් එකිනෙකට සම්බන්ධ කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ (features) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) **COCO සමාගම**, සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස සංස්ථාපනය කිරීමෙන් ඇති වාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) අපනයනය මූලික කරගත් සමාගමක් ලෙස **COCO සමාගමට** තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන් [Information and Communication Technologies (ICT)] භාවිතයෙන් ලැබෙන වාසි තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**සේෆ්ග්ලව්** ආයතනය අත්වැසුම් නිෂ්පාදනයේ යෙදී සිටින අතර, සිය නිෂ්පාදන කර්මාන්තශාලා කටුනායක නිදහස් වෙළෙඳ කලාපය තුළ පවත්වාගෙන යනු ලැබේ. **ජෙනී, සේෆ්ග්ලව්** හි සැපයුම් සේවා කළමනාකාරිණිය වන අතර, ඇය **සේෆ්ග්ලව් සමාගමේ** අපනයන සැකසීමේ කටයුතු සඳහා වගකීම දරණු ලැබේ. **ජෙනීගේ** රැකියාවේ එක් වගකීමක් වනුයේ මුහුදු උවදුරු, සොරකම් සහ ගිනි අනතුරුවලට එරෙහිව **සේෆ්ග්ලව් සමාගමේ** වත්කම් රක්ෂණය කිරීම වේ. මෙම කටයුතු ඉටුකිරීම සඳහා **ජෙනී** විසින් කර්මාන්තශාලා, නැව් සමාගම් සහ රක්ෂණ නියෝජිතයන් සමඟ අඛණ්ඩ සන්නිවේදනයන් සහ සම්බන්ධීකරණයන් පවත්වාගෙන යා යුතුයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) දේශීය සහ විදේශීය ඈල්මැති පාර්ශවයන් සමඟ සන්නිවේදනයේදී **ජෙනීට** මුහුණපෑමට සිදුවිය හැකි බාධක (barriers) තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(b) **සේෆ්ග්ලව් සමාගමට** රක්ෂණය මගින් ඇති ප්‍රතිලාභ තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) රක්ෂණයේ ඕනෑම මූලධර්ම දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**ඩයස්,** ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ අධ්‍යක්ෂකවරයෙකු වේ. ඔහුට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වැඩමුළුවක ප්‍රධාන දේශනය පැවැත්වීමට ආරාධනා කොට ඇත. කුඩා පරිමාණ කුළුබඩු වගාකරුවන් 100 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් මෙම වැඩමුළුවට සහභාගී වීමට ආරාධනා ලැබ ඇත. මෙම සුළු පරිමාණ කුළුබඩු වගාකරුවන් හට ශ්‍රී ලංකාවේ අපනයන හැකියාවන්, ජාත්‍යන්තර වෙළෙඳ ක්‍රියා පටිපාටි සහ ව්‍යාපාරවල වර්තමාන ප්‍රවණතා පිළිබඳව පැහැදිලි කිරීමට **ඩයස්** සැලසුම් කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අපනයනය ඉලක්ක කරගත් (export-oriented) කුළු බඩු වගාකරන්නෙකුට භාවිත කළ හැකි ප්‍රවාහන ක්‍රම (ways) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) යුරෝපීය වෙළෙඳපොළට තම නිෂ්පාදිත අපනයනය කිරීමට අපේක්ෂා කරන සුළු පරිමාණ කුළු බඩු නිෂ්පාදකයෙකුට විද්‍යුත් වෙළදාමෙන් [Electronic Trade (E-Trade)] ලැබෙන ප්‍රතිලාභ (benefits) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) විදේශ රටවල්වලට කුළුබඩු අපනයනය කිරීමේදී භාවිත කරනු ලබන මූලික ලියවිලි (primary documents) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකු වන **සමත්** කාබනික එළවළු වගාකිරීමේ කටයුතුවල නිරත වේ. ඔහු වසර 5 කට පෙර සිය කාබනික එළවළු ව්‍යාපාරය, කේවලස්වාමි (තනි පුද්ගල) ව්‍යාපාරයක් ලෙස ආරම්භ කළ අතර, වර්තමානයේදී එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් [Small and Medium Sized Enterprise (SME)] වශයෙන් සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කොට ඇත. **සමත්** තම ව්‍යාපාරයට වැඩිපුර ප්‍රාග්ධනය රැස්කිරීමේ අරමුණ ඇතිව එය කොළඹ කොටස් හුවමාරුවේ (Colombo Stock Exchange) ලැයිස්තුගත කිරීමට සැලසුම් කරයි. **සමත්** මෑතකදී ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම ව්‍යවසායකයාට (entrepreneur) හිමි සම්මානය දිනාගැනීමට ද සමත් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ව්‍යවසායකයෙකු සහ ව්‍යාපාරිකයෙකු අතර ඇති වෙනස්කම් තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරයක් වශයෙන් **සමත්ගේ** ව්‍යාපාරයේ කාර්යසාධනය ඉහළ නංවා ගතහැකි ආකාර (ways) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) රටක ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ, වැදගත් වීමට හේතු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

<u>C කොටස</u>

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**හැපි සුපර්** යනු දිවයින පුරා අලෙවිසැල් 300 කට අධික සංඛ්‍යාවක් ඇති සුපිරි වෙළෙඳසැල් දාමයකි. විවිධ වෙළෙඳ නාම යටතේ ඇති ක්ෂණික අලෙවියක් සහිත පාරිභෝගික භාණ්ඩ [Fast Moving Consumer Goods (FMCG)] අලෙවි කිරීමට අමතරව **හැපි සුපර්** ආයතනයට ඔවුන්ගේ වෙළෙඳ නාමය වන **හැපි සුපර්** යටතේ ද නිෂ්පාදිත රාශියක් ඇත. **හැපි සුපර්** ආයතනය මෑතකදී කිරි ගොවීන් සහ එළවළු වගාකරුවන්ගේ ජාලයක් සකස් කළ අතර, එමගින් ඔවුන්ගේ නැවුම් එළවළු සහ කිරි ආශ්‍රිත නිෂ්පාදිත ඔවුන්ගේ ළඟම පිහිටි **හැපි සුපර්** අලෙවිසැල් වෙත අලෙවි කිරීමට හැකියාව ලබාදෙන ලදී.

**හැපි සුපර්** මගින් ක්‍රියාත්මක කරන ලද කිරි ගොවීන් සහ එළවළු නිෂ්පාදකයන්ගේ ජාලය පිහිටුවීමේ ව්‍යාපෘතිය, මොණරාගල දිස්ත්‍රික්කයෙන් මුලිකවම ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වූයේ ප්‍රවාහනයේදී සිදුවන අපතය අවම කිරීම සහ අතරමැදි අලෙවිකරුවන් උපයන කොමිස් මුදල් ඉවත් කිරීම තුලින් සුළු පරිමාණ ගොවීන් සඳහා ඉහළ ආදායමක් ලබාදීමයි. **හැපි සුපර්** ආයතනය ගොවීන්ගේ නිවසටම ගොස් ඔවුන්ගේ අස්වැන්න එකතු කිරීම සඳහා වාහන සමූහයක් යොදවා ඇත. මෙම වැඩපිළිවෙල මගින් කුඩා පරිමාණ ගොවීන්ට ඉහළ ආදායමක් ලබාදීම සහතික කොට ඇත. මෙම ව්‍යාපෘතියේ මූලික සාර්ථකත්වය හේතුකොටගෙන නුවරඑළිය, මහනුවර සහ මාතලේ යන දිස්ත්‍රික්ක සඳහා ද මෙම ව්‍යාපෘතිය දියත් කිරීමට **හැපි සුපර්** ආයතනයේ කළමණාකාරිත්වයට අවශ්‍ය විය. මේ වන විට **හැපි සුපර්** ආයතනය සතුව කුඩා පරිමාණ එළවළු වගාකරුවන් සහ කිරිගොවීන් 800 කින් පමණ යුක්ත වන දිවයින පුරා ව්‍යාප්ත වූ ජාලයක් ඇත.

සමාගමේ අයතනික සමාජ වගකීම් [Corporate Social Responsibility (CSR)] ව්‍යාපෘතියක් ලෙස **හැපි සුපර්** ආයතනයේ කළමනාකාරිත්වය විසින් මොණරාගල ප්‍රදේශයේ කාබනික වගාකරුවන් සඳහා නොමිලයේ කාබනික පොහොර බෙදාහැරීම පිළිබඳව සළකා බලමින් සිටී. මෙම සමාජ සත්කාරක ව්‍යාපෘතිය සඳහා කාබනික පොහොර තම අලෙවිසැල්වල ඇති කාබනික අපද්‍රව්‍ය භාවිත කර නිපදවීමට **හැපි සුපර්** ආයතනය සැළසුම්කොට ඇත. එළවළු ගොවීන්ට කාබනික පොහොර ලබාදීමට අමතරව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව ගොවීන් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමට ද, **හැපි සුපර්** ආයතනය බලාපොරොත්තු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ශ්‍රී ලංකා රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීමෙහිලා **හැපි සුපර්** ආයතනයේ දායකත්වය **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) PESTEL විශ්ලේෂණය භාවිතයෙන් **හැපි සුපර්** ආයතනයේ ව්‍යාපාරික පරිසරය **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(c) ඉහත සඳහන් ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘතිය මගින් **හැපි සුපර්** ආයතනයට ලැබිය හැකි වාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(d) පාරිසරික තිරසාරභාවය කෙරෙහි **හැපි සුපර්** ආයතනයට සිය ව්‍යාපාරයේ අවධානය යොමුකළ හැකි ආකාර (ways) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(e) ව්‍යවසායකයෙකුට අවශ්‍ය වන ව්‍යවසායකත්ව කුසලතා දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |